...

11

# රූපවාහිනී මාධ්‍ය ක්‍රියාකාරීත්වය, ප්‍රචණ්ඩකාරී බලපෑම හා ළමා පරපුර

**සේන නානායක්කාර**
බී. ඒ. (ගෞරව) එම්. ඒ. (පර්යේෂණ) පී.එච්. ඩී. (ජනසන්නිවේදන) ජනමාධ්‍ය විෂය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකි. ගුවන්විදුලි, වේදිකා හා රූපවාහිනී නාට්‍යවේදියෙකි. ගත් කතුවරයෙකි. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයා ය.

"මම අම්මිට TV Kiss එකක් දෙන්න ගියා. අම්මි මට හොඳට ම ගැහුවා."

මේ, දිගු සත්‍ය කතාවක එක් අවසානයක්. කැලණිය බියගම ප්‍රදේශයේ මීට වසර 13කට පමණ පෙර මා විසින් පවත්වනු ලැබූ සමාජ සන්නිවේදනාත්මක සමීක්ෂණයක දී, ඊට මුහුණ දුන් එක්තරා මා පිය යුවළක් කළ සත්‍ය අනාවරණයක කොටසකි, ඒ. මෙම කෙටි ලිපිය කියවන ඔබ එකී සංසිද්ධිය දැනගත යුතු බැවිනුත්, මේ ලිපියෙන් මා අනවරණය කරන්නට අපේක්ෂිත අදහස් සමුදායට එය බෙහෙවින් අදාළ බැවිනුත් ඒ පිළිබඳ ව වඩාත් සංක්ෂිප්ත ව හෝ සඳහන් කිරීම උචිත යැයි හඟිමි.

සිංහල බෞද්ධ හැදියාවක් ඇති තරුණ අඹු-සැමි යුවළකට දාව උපන් මේ දරුවා වයස අවුරුදු තුනේ දී අකුරු කියවා පෙර පාසල් යවා සියලු කටයුතු සාර්ථක ව සිදුවෙමින් තිබිණි. නිසි කලට පාසලට ඇතුළත් කළ ඔහු සිය පාඩම් වැඩකටයුතුවලටත්, බාහිර ක්‍රියාකාරකම්වල මෙන් ම සිය ගුරු දෙගුරු නැසියන්ටත් දැක්වූයේ අපරිමිත ආදරයක්, භක්තියක් හා සෙනෙහසකි. තරුණ මා පිය යුවළ දරුවා ගැන අපමණ අපේක්ෂාවන් සහිත ව යහපත් ගුණගරුක සමාජ සාරධර්ම ම ඔහු ඇස ගැටෙන්නට, කන වැකෙන්නට හා අත්දකින්නටත් සැලැස්වූයේ මහත් වූ උනන්දුවෙනි. පුංචි පුතු ද ඊට ම ගැළපෙන සුචරිතවත් දරුවකු සතු පරමාදර්ශයන් පෙන්නුම් කරන්නට වූයේ සිය පාසලේ, දහම් පාසලේ මෙන් ම සෙසු සියලු තන්හි දී අප්‍රමාණ ලෙස කීර්ති ප්‍රශංසා ලබමිනි.

පුස්තකාලය තුළදී
පාවිච්චියට පමණයි.

පසු කලෙක දී මේ පුංචි කුරුලු කැදැල්ල තුළට තවත් ආගන්තුකයකුගේ සම්ප්‍රාප්තියක් සිදුවිය. ඒ, මීට පෙර දිනෙක එහි නොවූ වර්ණ රූපවාහිනී යන්ත්‍රයකි. පහ වසර ශිෂ්‍යත්ව විභාගය කට උඩ තිබිය දී මේ අමුත්තාගේ පැමිණීම ගැන තරුණ මව සුළු අකැමැත්තක් පළ කළ ද, එය දරුවාගේ ඉගෙනීමට සුවිශේෂ බාධාවක් නොවූ බැවින් ඔහු ඉතා ඉහළින් විභාගය සමත් වී තිබිණි. කලක් ගත විණි. දරුවා දැන් අට වසර පසු කරමින් සිටියි.

ක්‍රමයෙන් ඔහුගේ චර්යාවන් වෙනස් වෙයි. මාපියන් කෙරෙහි වෙනදා දැක්වූ ආදරය, භක්තිය තුළ යම් යම් වෙනස්කම් ඇති වනු ඔවුනට වැටහිණි. පොතට, පාඩමට හෝ ක්‍රීඩාවට හෝ ඔහු තුළ පෙර තිබූ සුවිශේෂ උනන්දුව රූපවාහිනිය කෙරෙහි ආරෝපණය වී ඇති බවක් ඔවුනට දැනිණි. දෙමාපියනට අවැසි වූයේ සිත නොරිදවා කෙසේ හෝ පෙර පරිදි ම ඔහු යහපත් අතට පත් කරන්නට ය. මේ වනවිටත් ඔහු පාසල් යන්නට ප්‍රථම මුහුණ කට සෝදවන්නේ, ඇඳුම් අන්දවන්නේ, කවන්නේ, පොවන්නේ හා සෙසු බොහෝ අවශ්‍යතා ඉටු කරනුයේ මේ ආදරණීය මවුගේ දෑතිනි. දරුවා පෙර පරිදි ම අහිංසක ය. සුරතල් ය. කෙළිලොල් ය. සියලු කටයුතු අවසන් කොට පියා සමඟ පාසල් යන්නට පිටත්වෙන දරුවා මවුගේ දෙපා වැඳ ගෙදරින් පිටවෙයි. නමුත්, එදින එය සිදු නොවූයෙන් පියා සිය පුතු ඇමැතී ය.

"පුතා අද අම්මට වැන්දෙ නැනේ... ගිහිල්ල අම්මට කියල එන්න... අපි යනව කියල."[1]

ඔහු තුළ තිබූ සෙල්ලක්කාර බව පෙර පරිදි ම ය. ඔහු සිය මව වෙත දිවී ය. මවගේ බෙල්ලේ එල්ලුනි. මවගේ මුහුණ සපුරා ග්‍රහණයට ගත් ඔහු, සිය මව සිහිනෙකිනිදු නොසිතූ නොපැතූ කාර්යයක නිරත විය. තත්පර ගණනක් උමතුවෙන් මෙන් හැසිරුණු මේ දරුවාගෙන් ගැලවෙන්නට මවට සෑහෙන වෙහෙසක් දරන්නට සිදුවිය. මව වැරෙන් දරුවා තල්ලුකොට ඔහුගේ කම්මුල් හරහා දැඩි ලෙස පහර දෙන්නට වූයේ පිස්සියක ලෙස ය. කිසිවකුට කතා කරගත නොහැකි ය. මවගේ මුහුණ රතු පැහැ ගැන්වී තොල් වෙවුලමින් කතා කළ නොහී, ගොළු ව බලා සිටින්නේ දෑස්වලින් කඳුළු පෙරමිනි. ඇයට කිසිවක් අදහාගත නොහැකි ය. සිදුවූයේ කුමක්දැයි සිතන්නටවත් ඈ කැමැති නැතුවාක් මෙනි. දරුවා ඉකිගසමින් හඬයි. කිසිවක් නොදත් පියා එතැනට පැමිණ කෑගසන්නට වූයේ සිය බිරිඳ වෙත චෝදනාවක් ද එල්ල කරමිනි.

"අගේට ඉස්කෝලෙ යන්න හිටපු දරුවට මොකද ඔයා මේ කළේ...? මොකක් ද වුණේ...?"

ඔහු ප්‍රශ්න කළේ ය. බිරිඳ තවමත් ගොළු වී ඇස් කන් අයා තුෂ්ණිම්භූත ව ඉකි ගසයි. තමන් නිවැරදි යැයි සිතූ දරුවා ඉකිගසා අඬමින් ම සිය පියා අමතන්නේ මෙසේ ය:

"මම අම්මිට TV Kiss එකක් දෙන්න ගියා. අම්මි මට හොඳට ම ගැහුවා..."[2]

දරුවා යළිත් අඬන්නට විය. එදින දරුවාගේ පාසල් ගමන නැවැතිණි. පියාට කරුණු අවබෝධ වූයේ වැඩ ඇරී ගෙදර ඒමෙන් පසු සිය බිරිඳ සිදු වූ සියල්ල ඔහුට නොවලහා පැවැසීමෙන් පසු ව ය.

මේ අමෙරිකාවේ චිකාගෝ නුවර හෝ යුරෝපයේ වෙනත් රටක හෝ සිදුවූවක් නොවන බව දැන් ඔබ හොඳින් දනී. අපේ පුංචි ලංකාව තුළ ම සිදු වූ මෙකී සිදුවීම පිළිබඳ ව අපට සරල ව සැලකිය හැකි ද? අපේ රටේ සමාජයේත්, දරුවාගේත් අනාගතය පිළිබඳ වඩාත් විමර්ශනශීලී ව සලකා බැලීමේ දී මෙබඳු සිදුවීම් පිළිබඳ අපගේ ප්‍රතිචාරය විය යුත්තේ කුමක් ද? සැබැවින් ම මේවා අප සමාජයේ පැවැත්ම උඩුයටිකුරු කරන සමාජ විපර්යාසකාරක ලෙස සැලකිය හැකි ද? නොඑසේ නම් එහි යථාර්ථවත් විද්‍යාත්මක පසුබිම කුමක් ද? බුද්ධිමත් ව සලකා බලන කල එයින් එළිදරව්

ශ්‍රී ජයවර්ධනපුර
විශ්වවිද්‍යාල පුස්තකාලය



කෙරෙන්නා වූ අධ්‍යාපනික කාරණා කවරේ ද? මේ වනවිට අප ඒ පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කර තිබේ ද? සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනමය වශයෙන් රාජ්‍ය හා පෞද්ගලික ක්ෂේත්‍රයන් තුළ මේ සම්බන්ධ ප්‍රතිචාරාත්මක යාන්ත්‍රණයක් සකස් කොට ඇත් ද? නොඑසේ නම් ඒ පිළිබඳ සමාජය දැනුවත් කිරීමෙහි ලා අවශ්‍ය සමාජ සන්නිවේදනමය මාධ්‍ය ක්‍රියාකාරිත්වයක් සිදු කෙරේ ද? මේ ආදී වශයෙන් ඒ පිළිබඳ විමර්ශනයේ දී අප සිත් තුළ මතු කෙරෙන ප්‍රශ්නකාරී තත්ත්වයන් අපමණ ය.

රූපය දෘෂ්ටිගෝචර ය. ඇස්, කන්, නාසා, දිව හා සම ආදී වූ පංචේන්ද්‍රියයන්ගෙන් වඩාත් වැදගත් වූ දෘෂ්ටීන්ද්‍රිය අප අධ්‍යාත්මය කෙරෙහි බලපෑම් කරන්නා වූ ආකාරය ඉතා සුවිශේෂ ය. ඉලෙක්ට්‍රෝන රූප රාශියකින් හා ශබ්ද මාලාවකින් කෙරෙන සංජානන ක්‍රියාවලිය රූපවාහිනිය මඟින් සිදු කෙරෙයි.[3] එය රූපමය හා ශබ්දමය සංඥා හා සංකේතාවලියක් ලෙස (Visual and Auditory signals and symbols) මිනිස් මනස හා සම්බන්ධ කෙරේ. මෙකී රූප හා ශබ්ද යම් කිසි හැඟීම් මාත්‍රයක් නියෝජනය කරයි. ඒවා අඩු වැඩි වශයෙන් ප්‍රබල හෝ දුබල හෝ විය හැකියි. බලපෑම් කාරකයක් ලෙස විචල්‍ය බවක් පෙන්නුම් කරයි. එහෙත්, කිසි යම් ගැඹුරු ප්‍රතිරූපයක නිෂ්පත්තියක් එමඟින් හෙළිදරව් කෙරේ.[4] එනම්, මිනිසුන් කතා කරන, කන බොන, අඳින පලඳින හා හැසිරෙන කුදුමහත් සකලවිධ ක්‍රියාකාරකම් පද්ධතියක පිළිබිඹුවක් මිනිස් මනසට ප්‍රදානය කරයි. ප්‍රේක්ෂකයෝ, රසිකයෝ හෝ පොදුවේ ගත්කල ග්‍රාහකයෝ එය නරඹති. ස්වකීය සිත හා කිසි යම් ගනුදෙනුවක යෙදෙති. එය ප්‍රතිචාරාත්මක ය. සැබැවින් ම, එය එක්තරා පෙළ කියවීමක් (Text Reading) වෙයි.[5] විටෙක එය අපි අනුකරණය කරමු. තවත් විටක පිළිගනිමු. පිළිකෙව් කරමු. දෘශ්‍යමය හා ශ්‍රව්‍යමය සංඥා හා සංකේත විසින් කිසි යම් වෙනස් අරමුණක්, පරමාර්ථයක්, විශ්වාසයක් හෝ ක්‍රියාකාරකමක් දක්වා හෝ මිනිස් සිත ගමන් කරවනු ලබන්නේ එලෙසිනි.

උක්ත සමීක්ෂණයේ දී මා මුණ ගැසුණු දරුවා සම්බන්ධයෙන් දැන් අපට කිව හැක්කේ කුමක් ද? ඔහු පෙන්නුම් කළ චර්යාත්මක වෙනස්වීම කෙරෙහි ලා මඳ පමණකින් හෝ ඔහු නිරන්තරයෙන් ගෙදර දී ඇසුරු කළ රූපවාහිනියේ බලපෑම සිදු නොවූ බවක් ද? නොඑසේ නම්, ඒ කෙරෙහි හේතුකාරක වන තරමේ වෙනස් ප්‍රබල අදිසි සමාජ බලවේගයක් ක්‍රියාත්මක වී ද?

ආචාර්ය සැලී වෝඩ් (Dr. Sally Ward) යනු මහා බ්‍රිතාන්‍ය ප්‍රමුඛ යුරෝපා රටවල දරුවන්ගේ කථන වර්ධනය පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ රාශියක් දියත් කළ ප්‍රමුඛ පෙළේ විද්‍යාර්ථියෙකි. රූපවාහිනී මාධ්‍යයත්, ළමා මනසත් අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිබඳ යථාර්ථය පිළිබිඹු කෙරෙන වැදගත් නිගමන දෙකක් ඇය විසින් හෙළිදරව් කරනු ලැබී ය.[6]

1. හුදු ඉලෙක්ට්‍රෝනික රූප පද්ධතිය තුළ දිදුලන මනස්කාන්ත බවට වහල් වෙන ළදරු මනස බොහෝ විට කාලය හා අවකාශය පිළිබඳ පැවතිය යුතු යථාවබෝධයෙන් ඈත්වෙන බව ඇය පවසයි. රූපවාහිනියෙන් දරුවා දකින දේ කෙරෙහි ඇස් අයාගෙන බලා සිටින්නටත්, කිසිදු ප්‍රතිචාරයකින් තොර, ඒක පාර්ශ්වික සන්නිවේදනයක (one way communication) යෙදෙන්නට හා එනිසා ම හුදෙකලාව කෙරෙහි ආසක්ත වූ දීර්ඝ නිහඬතාවක් අනුගමනය කරන්නට දරුවා පෙලඹෙන බව ඇගේ අදහසයි.

2. එහි ප්‍රතිරූපණය කෙරෙන මිනීමැරුම්, වෙඩි තැබීම්, බෝම්බ පිපිරවීම්, ලේ වැගිරවීම් ආදී රළු සිද්ධිමය ජවනිකා හා කර්කශ ශබ්ද තුළින් දරුවාගේ ආධ්‍යාත්මික ජීවනය තුළ යථාවත් ව පැවතිය යුතු සරල රිද්මය ප්‍රචණ්ඩ ලෙස බිඳ වට්ටවන බව ඇය හෙළි කරයි. සිය පර්යේෂණ රාශියකට හවුල් කොටගත් 800කට අධික දරු සමූහයකින් රූපවාහිනියට ආසක්ත ව සිටි දරුවන්ගෙන්

පුස්තකාලය තුළදී
පාවිච්චියට පමණයි.



සියයට 84%ක් දෙනා එබඳු රළු අත්දැකීම් දීර්ඝ කාලයක් තුළ නරඹා, රස විඳ ඒවා ප්‍රතිරූපණය කොට පෙන්වා ඇති බවත්, ඉන් 57%ක් කිසිදු අනුකම්පාවක් හෝ මෘදු ගතියකින් හෝ තොර හුදෙක් ආත්මාර්ථකාමී සිතිවිලිවලින් ම යුක්ත වූවෝ වූ බවත් ඇය කනගාටුවෙන් ප්‍රකාශ කර සිටින්නී ය.

දරුවන් රූපවාහිනිය හා හුදෙකලා කොට දෙමාපියන් සිය දෛනික කටයුතු ඉටුකර ගැනීම නිසා පවුල් සංස්ථාව තුළ පෙර තිබූ පොදු ක්‍රියාකාරකම්, පිළිසඳරමය සාකච්ඡාවන් හා සමීප අදහස් ගනුදෙනු ක්‍රමයෙන් අඩු වූ බවත්, එය පවුලේ අභ්‍යන්තරික සාමූහිකත්වයට බාධාවක් වූ බවත් ඇය පෙන්වා දෙයි.

අප බ්‍රිතාන්‍යයට හෝ යුරෝපයට හෝ යා යුතු නැත. යථෝක්ත අදහස හා සම්බන්ධ තවත් පූර්විකාවන් දෙක තුනක් අපට උපුටා දැක්විය හැකි ය. ඒවා ද එකිනෙකට පරස්පර මෙන් ම සමානත්වයක් ද දක්වන බව පෙනේ. පරස්පර වන්නේ එකී අර්ථ දැක්වීම් තුළින් යුග දෙකක් පිළිබිඹු කෙරෙන බැවිනි. සමාන වන්නේ ඒ දෙකෙහි ම සන්නිවේදනාර්ථ තුළ සමීප සමාජ ස්වභාවයක් හෙළිදරව් කෙරෙන බැවිනි. එනම්, "රූපවාහිනිය වූ කලී මිනිසා නැවතත් ගල්ගුහා ජීවිතයකට හුරු කරවන්නක් ය."[7] යන්නයි. දෙවැන්න, ඒ තුළින් "මිනිසා වඩාත් සංකීර්ණ ඉලෙක්ට්‍රෝන ලෝකයක් කරා ප්‍රවේශ වීමේ භාවනාවකට කමටහන් ලබනු ඇති"[8] බවයි. මෙකී හඳුන්වාදීම් දෙකෙන් ම හෙළිදරව් වනුයේ රූපවාහිනී මාධ්‍යය විසින් යහපත් මානව සම්බන්ධතා තවදුරටත් අවගමනය කරා කැඳවන බවක් නොවේ ද?

විශේෂයෙන් ම දරුවන් හා දෙමාපියන් අතර මානව සම්බන්ධතා ගිලිහීම යනු ඉතා ව්‍යසනකාරී ඛේදවාචකයක් බව අප දන්නා සමාජ සත්තාවකි. රටක, සමාජයක හෝ පවුලක හෝ අභ්‍යන්තරයෙහි පැවැතිය යුතු යහපාලනය පලුදු කිරීමෙහි ලා වන ප්‍රබලතම සාධකය එය බව නූතන සමාජ විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි.[9] දරුවන් හා දෙමාපියන් අන්‍යෝන්‍ය වශයෙන් අගය නොකරන සමාජයක යහපැවැත්ම උගහට ය. මෙහි දී වඩාත් වගකීම පැවැරෙනුයේ හුදෙක් දෙමාපියන් මත වීම ප්‍රකට කාරණයකි. ස්වකීය දරුවන් යා යුතු මඟ පිළිබඳ කියා දීම හා ඊට අදාළ මාර්ගෝපදේශකත්වය නිසි පරිදි ලබා දීම දෙමාපියන් සතු සුවිශාල වගකීමක් ලෙස සැලැකේ. එහි දී දරුවන් සිය මහඟුතම වස්තුව ලෙස සලකා කටයුතු කිරීම මානව දහමක් බවට පත් ව ඇත. සුප්‍රකට බුද්ධ දේශිතය පවා "පුත්තා වත්ථු මනුස්සානං"[10] යනුවෙන් හෙළිදරව් කරනුයේ එකී සුභාෂිතය ම ය. ලෝක ප්‍රකට මහා ලේඛක විලියම් ශේක්ෂ්පියර් ප්‍රකාශ කළේ, "මිනිසාගේ පියා දරුවා ය" යනුවෙනි. රුසියානු මහා ලේඛක මැක්සිම් ගෝර්කි, ඉංග්‍රීසි ජාතික එච්.ජී. වේල්ස්ට ලියූ ප්‍රකට ලියුමක් ද අපට මේ පිළිබඳ වැදගත් සාක්ෂි සපයයි. 1916 අග භාගයේ හෝ 1917 මුල් භාගයේ හෝ පෙත්රොගාඩ්ස් හෙවත් පැරණි පීටස්බර්ග් නගරයෙන් තැපැල් කෙරුණු මෙම ලිපිය තුළ මෙබඳු වචන කිහිපයක් ද ගැබ් ව තිබූ බව කියැවේ.

"අන් හැම කාලෙකට ම වඩා අද අපට මහ පොළොව මත වැදගත් ම වස්තුව වෙලා තියෙන්නෙ, ළමයි. ලෝකය ගැනත්, ඒ ලෝකයේ ශ්‍රේෂ්ඨ මිනිසුන් ගැනත්, ඔවුන් මිනිසාගේ ප්‍රීතිය උදෙසා නිම කළ කෘතීන් ගැනත් දරුවන් දැනගත යුතු ව තිබෙනවා. මේ දුෂ්ට, නිස්සාර, උන්මත්තක යුද්ධයේ ලේ ගැවුණු මලකඩවලින් ඔවුන්ගේ හදවත් පිරිසිදු කිරීම, අපට අයත් කාර්යයක් වෙලා තියෙනවා. ඒ හදවත්වල මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ආදර භක්තියත්, ගෞරවයත් ජනිත කරවන්න ඕන. ඒ හදවත් භක්තියෙන් පුරවන්න ඕන."[11]

මේ ලෝකය මීට වඩා යහපත් වනුයේ එතුළින් ම පමණක්, එනම්, අනාගත දරු පරම්පරාව යහපත් සමාජයක පදනමක් කොටගතහොත් බව පොදු පිළිගැනීමයි. 1994 දෙසැම්බර් 24 වෙනිදාට

යෙදුණු ජාත්‍යන්තර ළමා ජනමාධ්‍ය දිනය නිමිත්තෙන් ලෝක ප්‍රකට තෙරේසා මවුතුමිය විසින් කරන ලද ප්‍රකාශය ද ඊට ම දෙස් දෙයි.

"අපි වැඩිහිටියන් වශයෙන් අපෙන් ම ඇසිය යුතු ප්‍රශ්නයක් තිබේ. එනම්, අප කරන කිසි යම් දෙයක ප්‍රතිඵලය කුමක් ද? එය දරුවන්ගේ යහපතට හේතු නොවේ නම්...? දරුවන්ගේ වර්තමානය පමණක් නොවේ, ලෝකයේ හෙට දිනය ද ඔවුන් මත රඳා පවතී. සෑම පවුලක ම වැදගත් ම කොටස දරුවෝ ය. මගේ යාඥාව නම් ලෝකයේ ජනතාව හා ඔවුන්ගේ නායකයන් මෙය කිසිදා අමතක නොකළ යුතු ය යන්නයි."[12]

දරු පරපුර අපට කෙතරම් වැදගත් ද? ඒ පිළිබඳ ව අප අවධානය යොමු කළ යුත්තේ කෙසේ ද? යන කාරණා රැසක් එමඟින් හෙළිදරව් කෙරෙනු ඇත. ලෝකයේ පළමු සමාජවාදී රාජ්‍යයේ අසහාය දේශපාලන නායකයාණන් වූත්, රුසියානු ජාතික ශ්‍රේෂ්ඨ විප්ලවවාදියාණන් වූත් ව්ලැඩිමීර් ඉල්විච් ලෙනින් ප්‍රකාශ කළේ "හොඳම දේ දරුවන්ට" (The Best thing for children)[13] යනුවෙනි.

එබඳු මහඟු දරු පරපුරක අනාගත යහපැවැත්ම කෙරෙහි රූපවාහිනියේ බලපෑම කෙබඳු විය හැකි ද? මහාචාර්ය මැක්ස් එෆ්. මිලිකන් (Prof. Max F. Milicon) සඳහන් කරන පරිදි පසුගිය දශක ද්වය ඇතුළත ලෝක මානව චර්යාව කෙරෙහි වැඩියෙන් ම බලපෑම් සහගත වූයේ අතිශය ශීඝ්‍රාකාරී ලෙස වර්ධනය වූ විද්‍යුත් මාධ්‍ය ක්‍රියාකාරිත්වයයි.[14] එය සත්‍යයක් බවත්, ඊට ආනුශාංගික ඌන පූර්ණයක් ද ඇති බවත් මහාචාර්ය ජේම්ස් ඩී. පැලෝ (Prof. James D. Pallow) ඉදිරිපත් කරන අදහසකින් හෙළිදරව් කෙරේ. "සාම්ප්‍රදායික සමාජයන්හි මෙතෙක් පැවැති යහපත් කුලාචාර හා ඥාන මට්ටම් සමුදායක් යටපත් කරන්නට වැරදි ලෙස ක්‍රියා කරන නූතන ජනමාධ්‍ය ඇඩි ලෙස හේතුකාරක වී ඇත."[15]

ඉදින්, මේ මහා මානව සමාජයේ කොටස්කරුවන් වූ අපගේ ම දරුවන් මෙකී ව්‍යසනය කෙරෙහි ගොදුරු නොවන බවට සාධාරණ කරුණු ඉදිරිපත් කළ හැක්කේ කවරකුට ද?

මිචෙල් ඩබ්. ගැම්බල් හා ටෙරී කේ. ගැම්බල් නම් වූ සුප්‍රකට සමාජ සන්නිවේදන විශාරදවරුන් කියන්නේ සාමාන්‍ය දරුවකු අද අවුරුදු 15ක් පමණ වනවිට රූපවාහිනියේ පෙන්වූ මිනීමැරුම් ඇතුළු බරපතළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් දළ වශයෙන් සංඛ්‍යාත්මක ව ගත් කල 15,000ක් පමණ නරඹා ඇති බවයි.[16]

එහි රාශිභූත බලපෑම (Cumulative effect) හෙවත් දීර්ඝකාලීන ප්‍රතික්‍රිය ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර කරන ඔහු ඒ සඳහා උද්ධෘත කොටගත්තේ ප්‍රකට මාධ්‍ය පර්යේෂක විද්‍යාර්ථියකු වූ හැරී ජේ. ස්කෝර්නියා (Harry J. Skornia) ගේ පර්යේෂණ නිගමනයකි. එය නූතන රූපවාහිනී මාධ්‍ය හා ලෝක ළමා පරපුර සම්බන්ධයෙන් ගත්කල වඩාත් වැදගත් වන බැවින් එලෙස ම උපුටා දක්වමි.

"If I were to attempt to destroy nation internally, I would brainwash that nation into accepting violence. I would educate the masses to hate and kill and burn and destroy. I would condition people to tolerate violence as an acceptable type of behaviour condone its use on the most effective means to solve problems. I would provide specific lessons in the use of guns and knives and show how cars can be used as instruuments of deaths. I would present these informations entertainingly - in the form of Television."[17]

ප්‍රචණ්ඩත්වය රැගත් හුදු බොළඳ විනෝදාස්වාදය තුළ ප්‍රකට කෙරෙන පශ්චාත් සංජානනීය බලපෑම කෙබඳු ද? යන්න ඉන් වඩාත් පැහැදිලි කෙරෙනු ඇත. "යකඩ මල්ලට ගුල්ලො ගැහුව නම් හාල් මල්ල නොබලා ම විසි කරන්නැයි" පුරාණ ආප්තෝපදේශයක් අප උගෙන ඇත. මෙහි දී ද

පුස්තකාලය තුළදී
පාවිච්චියට පමණයි.



අපට යළිත් සිහි කැඳවන්නේ අවබෝධය සහිත මනා වැඩිහිටි සමාජයටත් මෙය දරාගත නොහෙන රුදුරු බලපෑම් සහිත විපර්යාසකාරකයක් නම්, චූල ළමා සමාජය හා ඔවුන්ගේ අනාගතය කෙරෙහි ලා එහි කෲරතර බලපෑම කෙතරම් ද යන්නයි.

චිකාගෝහි ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යාව පිළිබඳ මහාචාර්ය ලෙන්ඩ් ඩී. එරන් ප්‍රකාශ කරනුයේ රූපවාහිනියේ විකාශිත ප්‍රචණ්ඩ ක්‍රියා අධිග්‍රහණය වූ කලි සමාජයේ කලහකාරී බවටත්, අපරාධ හා විනය විරෝධී සමාජ ප්‍රතිවිරෝධතාවන්ටත් සත්‍ය වශයෙන් ම හේතු වන බවයි.[18] කිසිදු කොන්දේසියකින් තොර ව සියලු සමාජාර්ථික හා බුද්ධි මට්ටම්වල පසුවන ගැටවර වියේ ගැහැනු-පිරිමි දරුවනට මෙය අතිශයින් බලපෑම්සහගත වන බව ද[19] ඔහු සිය පර්යේෂණ නිගමන තුළින් සනාථ කරයි.

දරුවා නිරන්තරයෙන් අසන, දකින, අත්විඳින කුදුමහත් සමාජ සංසිද්ධීන් ස්වකීය ජීවන ගමන් මාර්ගය කෙරෙහි ලා වන බලපෑම් සහගත සංඥාවන් වෙයි. රූපවාහිනිය බඳු ප්‍රබල ආකර්ෂණීය ජනමාධ්‍යයකින් සිය මනසට ඇතුළු කෙරෙන ඉඟි ඔවුන්ගේ විශ්වසනීයත්වය (Credibility) වඩවාලයි. එමගින් ගොඩනැගෙන පරිකල්පනය (Imagination) විසින් ඔවුන්ගේ අත්දැකීම් ක්ෂේත්‍රය (Field of Experience) පෝෂණය කෙරේ. එය යහපත් ද අයහපත් ද යන්න විමසීමට වඩා හුදෙක් පෘතග්ජන ප්‍රතිචාරාත්මක සිතුවිලි දාමයක දැවටෙන්නට ඔහු උත්සුක වේ. ඒ තුළින් මතු කෙරෙන අභිප්‍රේරණය (Motivation) හෙවත් පෙලඹවීම (Persuation) සිය ජීවිතය ආක්‍රමණය කරනුයේ ඔහුටත් නොදැනුවත්ව ම ය.

යම් කිසි සමාජයක ආරක්ෂණය (Social Protection) සහ සමාජ පාලනය (Social Control) උදෙසා සාධනීය ලෙස බලපවත්නා වූ සාධක කිහිපයකි.[20] එනම්,

i. සදාචාරය (Morals)
ii. වාරණය (Censorship)
iii. මානව සාරධර්ම (Human Values) යනුවෙනි.

මෙහි සදාචාරය හා මානව සාරධර්ම යන අංශද්වයෙහි ලා පරස්පර වූ වාරණය යන්නක් ද කුළුගැන්වෙනුයේ ඇයි? සාමාන්‍ය පෘතග්ජන මානව පරපුරක් අතර වාරණයෙන් තොර යහපත් සමාජ පසුබිමක් අපේක්ෂා කිරීම උගහට බැවිනි.

දියුණු යැයි සම්මත අමෙරිකාව ප්‍රමුඛ යුරෝපීය රටවල පවා මහජන රූපවාහිනී සංකල්පය (Public Television Concept) ආරම්භ වන්නේ එබැවිනි. 1930 දශකයේ දී විධිමත් රූපවාහිනී සේවාවක් ආරම්භ වූ අතර, එය වර්ණ රූපවාහිනී තාක්ෂණය දක්වා පරිවර්තනය වන්නට දශක දෙකක පමණ කලක් ගත විය. අමෙරිකාවෙන් හා බ්‍රිතාන්‍ය ප්‍රමුඛ යුරෝපයෙන් දියත් වූ මේ තාක්ෂණ විප්ලවය පසුකාලීන ව කුඩා රටවල සමාජ, දේශපාලනික හා සංස්කෘතික කම්පන ඇති කරන්නට සමත් විය. අමෙරිකානු ජාත්‍යන්තර සන්නිවේදන ඒජන්සිය[21] (International Communication Agency) සඳහන් කරන අන්දමට 1970 දසකයේ මැද භාගය වන විට අමෙරිකානු පවුල් 97%කට (පවුල් 7 කෝටි 77 ලක්ෂයකට) රූපවාහිනී යන්ත්‍ර හිමි ව තිබිණි. මේ වන විට අමෙරිකාවේ ක්‍රියාත්මක වෙමින් තිබෙන ප්‍රධානතම මෙන් ම, අතිශය ජනප්‍රියතම රූපවාහිනී ජාලා ත්‍රිත්වය වූ ABC (American Broadcasting Company), NCB (National Broadcasting Company) හා CBC (Colombia Broadcasting Systems) එකල ද ප්‍රමුඛත්වයෙහි විය.

1970 දශකයෙන් ආරම්භ වූ ප්‍රබල රූපවාහිනී තාක්ෂණ විප්ලවය තුළ සුවිශේෂ පරිවර්තනයන් රාශියක් කැපී පෙනිණි. අප නිබන්ධය කෙරෙහි මහත් වූ පරිද්දෙන් අදාළ වන්නා වූ එකී පරිවර්තනයන් මෙසේ ය:

i. ගෘහස්ත චන්ද්‍රිකා පද්ධතිය (Home Satellite System)
ii. කේබල් රූපවාහිනී පද්ධතිය (Cabal Television System)
iii. ප්‍රජා ඇන්ටෙනා රූපවාහිනී (Community/Antenna Television)

මේ සියල්ල උපයෝගී කොටගනිමින් ප්‍රධාන පෙළේ රූපවාහිනී නාළිකා (Television Chanels) 250කට වඩා අමෙරිකාව තුළ ක්‍රියාත්මක කෙරෙන අතර, ඒවා සියල්ල වාණිජ සේවාවන් බවට ප්‍රකාශිත ය. ඒවායින් විකාශය කෙරෙන බොහෝ වැඩසටහන් තුළින් ළමා පරපුරේ රුචිකත්වයට, රසවින්දනයට හා සමස්ත අනාගත අපේක්ෂාවන්වලට කෙරෙන හානිය අති විශාල බැව් පෙනී ගොස් ඇත. එබැවින් ම, සියලු අමෙරිකානු ප්‍රාන්තවල ක්‍රියාත්මක කළ හැකි පරිදි මහජන රූපවාහිනී සේවා (Services of Public Television) පිහිටුවන්නට විය. දරුවන් සඳහා වාරණය ස්වාභාවික ව ම ක්‍රියාත්මක වන පරිදි ස්මාට් ක්ලිප් (Smart Clip)[22] නම් තාක්ෂණය භාවිතයෙන් ඒවා විකාශය කෙරේ. කිසිදු වාණිජමය ලාභාපේක්ෂාවකින් තොර ව, සියලු වෙළෙඳ දැන්වීම්වලින් බැහැර ව, ස්වේච්ඡා පදනමින්, හුදෙක් සමාජ යහපත අරමුණු කොටගෙන ම දියත් කෙරෙන මහජන රූපවාහිනී සේවාව අද ද බටහිර ළමා පරපුර අතර ජනප්‍රිය ව පවතින අතර, බුද්ධිමත් දේශපාලනඥයන්, අධ්‍යාපනඥයන්, ධනවතුන් හා කලාකරුවන් ඇතුළු සමාජ හිතකාමී ප්‍රජාව මේ කෙරෙහි මහත් වූ පිටුබල සපයන බව ද පැවැසේ.

සුවිශේෂයෙන් ළදරු මනස දූෂ්‍ය කිරීමේ ඓතිහාසික පාපකර්මයෙන් ගැලවෙන්නටත්, අපරාධ හා ප්‍රචණ්ඩ ක්‍රියා රැගත් විනෝදාස්වාදනය කෙරෙන් දරු පරපුර මුදවා ගන්නටත් මේ වන විට ප්‍රබුද්ධ අමෙරිකානු ජන සමාජය උත්සුක වනු දැකිය හැකි ය.

රූපවාහිනී ප්‍රචණ්ඩ ක්‍රියාවලිය පිළිබඳ ව විමර්ශනයේ දී ඊට පෙර විසූ ලෝකප්‍රකට කලාකරුවන් ද එය සිය කෘතීන් කෙරෙහි යොදාගත් බවට මත පළ වනු පෙනේ. එහෙත්, ඒ පිළිබඳ වඩාත් මධ්‍යස්ථ හා යථාර්ථවාදී පැහැදිලි කිරීමක් ද නැතුවා ම නොවේ.

"ශේක්ෂ්පියර්, දොස්තොවොස්කි වැනි සම්භාව්‍ය ලේඛකයන් සිය කෘතීන්ට අපරාධ පාදක කරගන්නේ සුපර්මෑන්, ස්ටාස්කි ඇන්ඩ් හච්, බිග්වැලි වැනි කෘතීන්ගේ ප්‍රචණ්ඩ ක්‍රියා හා අපරාධ යොදා ගන්නා අන්දමට නොවේ. විශිෂ්ට නිර්මාණකරුවකු මේවා උපයෝගි කරගන්නේ මිනිස් ජීවිතයේ අඳුරු අගාධයන්හි කිමිද ජීවිතය පිළිබඳ නුවණැස පාදා පුළුල් අවබෝධයක් ලබා දෙන අන්දමටයි. තුන්වන පෙළේ නිර්මාණකරුවෙක් මිනීමැරුම්, ප්‍රචණ්ඩ ක්‍රියා හා අපරාධ උපයෝගී කරගන්නේ තමන්ගේ කෘතිය විකුණා ගැනීමට අවශ්‍ය ප්‍රධාන පෙළේ රසකාරකයක් හෝ මානසික ප්‍රහේලිකාවක් හෝ හැටියටයි."[23]

එකී රසකාරකය තුළින් ළමා පරපුර තුළ ජනප්‍රිය මතවාදයක් ගොඩනගන්නටත් (Construct of popular Ideology), එමගින්, යථාර්ථයෙන් බැහැර වූ මායාවී ලෝකයක් (Fantasy World) සඳහා පදනම් සකසන්නටත් ඔවුහු උත්සුක වෙති. විනෝදය තුළින් යථාර්ථය (Reality through the entertainment) අවබෝධ කරවනු වෙනුවට උක්ත මායාවී ලෝකය තුළ දරුවා සිරකර තැබීම හෝ අවම වශයෙන් ඔහු ඒ කෙරෙහි හුරු වීමට හෝ ඉඩ අවකාශ ලබා දීම වූ කලි නූතන සමාජාර්ථික හා දේශපාලන රටාව තුළ වන ප්‍රමුඛතම අනන්‍යතාවක් බවට පත් ව ඇති බව පෙනේ.

අපරදිගටත් වඩා පෙරදිග තත්ත්වය වඩාත් ඛේදජනක බව සමාජ විද්‍යාඥයින්ගේ අදහසයි. ශ්‍රී ලංකාව, ඉන්දියාව ඇතුළු දකුණු ආසියාතික කලාපීය රටවල තත්ත්වය කෙසේ වුව ද, ජපානය වැනි වඩාත් සුවිශාල සංවර්ධනයක් කරා ප්‍රවේශ ව ඇති පෙරදිග රටක පවා මෙකී ව්‍යසනකාරී ව්‍යාප්තිය අතිශය ශීඝ්‍රාකාර ව සිදු ව ඇති බවට සාක්ෂි අපමණ ය. පෙර පැවැති අති උදාර නෝ, කබුකි නාට්‍ය සම්ප්‍රදායයන් අද ජපානයෙහි පෙනෙන තෙක් මානයක නැති බවත්, ඒ වෙනුවට වීඩියෝ ක්‍රීඩා සහිත සමාජ ශාලා හතු පිපෙන්නාක් මෙන් විවෘත කෙරෙන බවත් කියැවේ. ඒ අනුව, වීඩියෝ ක්‍රීඩා කර්මාන්තය එහි වැඩි ම ආදායම් ලබා දෙන වෙළෙඳ උපක්‍රමය ලෙස පිළිගැනී අවසාන ය. හුදෙක් බොළඳ රසාස්වාදනය ගෙන දෙන අතිශය ඕලාරික ප්‍රචණ්ඩ ක්‍රියා, මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ ඇතුළු ලිංගික ක්‍රියාකාරකම් බහුල වශයෙන් මේ වීඩියෝ ක්‍රීඩාවල අන්තර්ගතය බවට පත් ව ඇත. කුඩා දරුවන් හා තරුණ පිරිස් බහුතරයක් මේ වීඩියෝ හල් අසල රැස් කකා සිටින බව පැවැසේ. සාම්ප්‍රදායික ජන ජීවිතයේ දේවාල භූමියට ඉලෙක්ට්‍රෝනික මාධ්‍යයේ පැමිණීම, සම්ප්‍රදාය අගය කරන අතළොස්සක් ජපන් ජාතිකයින්, දේව කෝපයක් ලෙස සලකන බව විචාරකයෝ කියති. හිරෝෂිමා නාගසාකි ඛේදවාචකය තුළින් යළි නොවැටෙන්නට උපන් උදාර ජපන් ජාතිකත්වය හෙට කොයිබට දැයි යන්න අද ගැටලුවක් බවට පත් ව ඇත.

ජපානයේ ම පළ කෙරෙන "Picture Friend" නම් සඟරාව (A window of Japan) ඇසුරෙන් මේ පිළිබඳ කෙරුණු විවරණයක සඳහන් අදහසක් මෙහි දී උද්ධෘත කරනු කැමැත්තෙමි.

"ආසියාතික අප ක්‍රමයෙන් යකඩ, වානේ හා ප්ලාස්ටික්වලින් නව සංස්කෘතීන් නිර්මාණය කරමින් සිටින අතර, බටහිර ජාතීහු ආසියානු දර්ශනය හදාරා විමුක්තිය සොයා යමින් සිටිති. ඉතින්... මතු යම් දිනෙක මෛත්‍රී බුදුහාමුදුරුවෝ අමෙරිකාවේ ෆිලඩෙල්ෆියා නුවරින් බිහිවෙති. එහෙත්, ආසියාවේ අපි වීඩියෝ ගේම් ගසමින් සිටිමු."[24]

ඒ අනුව, අපරදිග බලා පෙරදිග සොයා ගන්නට අද අපට සිදු වී තිබෙන බව කීම එක් අතකින් අතිශයෝක්තියක් නොවේ. අපේ යටගියාව හා බැඳුණු ඉතිහාසය හා අපේ උරුමයන් අධ්‍යයනය තුළින් සොයා ගත යුතු අපේකම වෙනුවට, අපේ උන් බටහිරින් ණයට ගත් ජනප්‍රිය සංස්කෘතිය තුළින් අපේ ම දරු පරපුරේ යහපත් අනාගත ප්‍රවේශයෙහි ලා මුරකපොලු (Barriers) අටවන්නට පටන් ගෙන ඇති බවක් හැඟේ. ජනප්‍රිය සංස්කෘතිය තුළ විවෘත ආර්ථිකයෙහි උණු උණුවේ අලෙවි කෙරෙන පහත් ලිංගිකත්වය, නීච අනුරාගය, බොළඳ තාරුණ්‍යය හා කුතුහලය දනවන හුදු ප්‍රචණ්ඩත්වය ඒ සඳහා උපයෝගි කොට ගනිමින් ඇති බව පෙනේ.

කුමාරතුංග මුනිදාස, එදිරිවීර සරච්චන්ද්‍ර, සෙනරත් පරණවිතාන, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ හා මහගමසේකර බඳු බොහෝ චිර ප්‍රකට යුග පුරුෂයන් නිර්මාණය වූයේ එබඳු සාටෝපසහගත බොළඳ ජනප්‍රිය සංස්කෘතියක අනුහසින් නොවේ. දේශීය ආධ්‍යාත්මික චින්තනයක් සමඟ බැඳුණු ගැඹුරු සමාජ භාවිතාවක හා ඊට ම සාපේක්ෂ සමාජ ක්‍රියාකාරකම් සමුදායක බල මහිමයෙනි.

"මුනි සිරිපා සිඹිමින්නේ
සමනොළ ගල සිරසින්නේ
මඳ සුළඟයි මේ එන්නේ
මගේ පුතා නැළැවෙන්නේ..."

ටිබැට් ජාතික එස්. මහින්ද හිමියන් විසින් රචිත එම ගී පැදි කඩ කරණකොටගෙන ළදරු මනස තුළ සංජානනය කෙරෙන අනන්‍යතාව කෙබඳු ද? හුදෙක් අර්ථ ශූන්‍ය පදවැල් සහිත අධි ධ්වනිය හා පුහු ඝෝෂාව රැගත් ප්‍රවේගකාරී තප්පුලැම් දරුවනට බලෙන් අසන්නට හා දකින්නට සලස්වනු

වෙනුවට, මෙබඳු දේශීය ප්‍රතිෂ්ඨාවක් සහිත සුනිශිත නිර්මාණ ඔහු සිතට කාවැද්දීම අත්‍යවශ්‍ය වන්නේ එබැවිනි. පරමාදර්ශී අධ්‍යාපනයේ පරිසමාප්ත අභිප්‍රාය ලෙස ගැනෙන දැනුම, ආකල්ප හා කුසලතාව උදෙසා වන මුඛ්‍ය පදනම වැටෙනුයේ ඒ මත ය. රූපවාහිනී මාධ්‍ය වූ කලි ඒ සඳහා ම සුවිශේෂ වූ ප්‍රබලතම සංවාහකයා බවට පත්වෙයි.

මන්දයත්, ඒ තුළින් සිදු කෙරෙන මතවාදිමය ගොඩනැංවීම (Ideological Construction) වඩාත් ස්ථිතික බැවිනි. හංගේරියානු සමාජ විද්‍යාඥයකු වූ කාර්ල් මැන්හයිම් (Carl Manheim) ඉදිරිපත් කරන ලද සමාජ හා සංස්කෘතිකමය මතවාදය (Social and Cultural Ideology) පසුකාලීන ව පෙරදිගටත් පොදු වූ සර්වකාලීන, සාර්වත්‍රික, සර්වභෞමික සුභාෂිතයක් වී ඇත. ඒ අනුව, දරුවාගේ මානසිකත්වය කෙරෙහි හඳුන්වා දිය යුතු දේශීයත්වය, මානව හිතවාදය හෝ ජගත් සෞන්දර්ය පිළිබඳ පැවැතිය යුතු ගර්වය හා අභිමානය ද ඒ තුළින් අවබෝධ කොට දිය හැකි ය. ආකල්ප වඩවාලීම තුළින් චර්යාව පෝෂණය කිරීමේ විද්‍යාත්මක ක්‍රමවේදය (The Scientific Method of developing behavior through the arising good attitudes) ඒ තුළින් ක්‍රියාත්මක කෙරෙන බැවිනි.

ප්‍රචණ්ඩත්වය හා අසහනකාරී පීඩනය විසින් එය සපුරා නිෂේධනය කරනු ලබයි. දෙනෙත් ග්‍රහණය කරගන්නා ආකර්ෂණශීලී රූපාවලිය තුළ දරුවාගේ මනස් ලෝකය ඉදි කෙරෙනුයේ නිරායාසයෙනි. මූලික ජීව විද්‍යාත්මක සත්‍යතාවක් ලෙස ඒ බව සනාථ කරවන මහාචාර්ය ලෙනාඩ් එරන් (Prof. Leonard Eron) ප්‍රකාශ කරනුයේ එබඳු රූපවාහිනී ජවනිකා සඳහා පෙනී සිටින දරුවන් කෙරෙහි ද සමාජය ප්‍රබල අවධානයක් යොමු කළ යුතු බවයි.

පසළොස් හැවිරිදි ලැසී චැබර්ට් (Lacey Chabert), Party of Five's, ටෙලි චිත්‍රපටයේ රඟපාද්දී මුහුණ දෙන බැරෑරුම් අත්දැකීම් අතිශය ඛේදනීය වෙයි. ක්ලෝඩියා (Claudia) නම් කටුක, කර්කශ දිවි පෙවෙතක් සහිත දැරියකගේ චරිතයක් වූ එහි, ඇගේ දෙමාපියෝ රිය ගැටුමකින් මිය යති. වැඩිමහලු සොහොයුරිය ස්කොට් වොල්ෆ් (Scott Wolf) මත්ලෝලී තරුණියක් වන අතර, අනෙක් සොහොයුරා වූ මැතිව් ෆොක්ස් (Mathew Fox) පිළිකා රෝගයකට ගොදුරු වන්නෙකි. මේ සංසිද්ධි දාමය අතරතුර ක්ලෝඩියාගේ ජීවිතය ගලා යන අයුරු අතිශය පීඩාකාරී වෙයි.

ජීනා මැලොන් (Gina Malon) නම් ප්‍රකට ළදැරියගේ රඟපෑම් ද ඊට ම සමාන වෙයි. "Basted out of Carolina" ටෙලි වෘත්තාන්තයේ ඇය අපචාරයට ගොදුරු වන දැරියකි. "Hidden in America" හි දුෂ්කර දිවි පෙවෙතක් ගෙවන දිළිඳු දැරියක් වන අතර, "Ellen Foster" හි මත්ලෝලිත්වය, වාර්ගික අගතිය, අතරමං වීම හා මරණය වැනි දුර්භාග්‍ය සම්පන්න අත්දැකීම් ලබන චරිතයක් නිරූපණය කරන්නී ය. එහි ඇගේ ජීවිතය අතරතුර නිරූපණය කෙරෙන සමාජ සංඝට්ටන අතිශය පීඩාකාරී ය. රිදුම්දෙනසුලු ය. ප්‍රේක්ෂක මනසට වුව දරාගත නොහෙන වේදනාවක් හා ජීවිතය පිළිබඳ අසහනකාරී උද්වේගයක් හා ද්වේෂයක් ද ළඟා කරවන්නකි. කෑම්-බීම්, ඇඳුම්-පැළඳුම් හා වෙනත් සුඛෝපභෝගී භාණ්ඩ සම්බන්ධයෙන් වූ ළදරු වෙළෙඳ දැන්වීම් කෙරෙහි ද මහාචාර්ය ලෙනාඩ් එරන්ගේ චෝදනාව ඒ හා සමාන ය. ඉච්ඡාභංගත්වය හා අධිතෘෂ්ණාධික ආකර්ෂණය අතර දෝලනය කෙරෙන ළදරු මනස තුළ සිදු කෙරෙන ආත්මීය කඩා වැටීම අතිශය බලපෑම් සහගත බව ඔහුගේ අදහසයි.

මයිකල් නොවාක් (Michael Novark) නම් මනෝ විද්‍යාඥයාගේ සංකල්පයක් උපයෝගී කොටගෙන මේ පිළිබඳ අදහස් දක්වන අපේ ප්‍රකට විචාරකයකු වූ ගාමිණී විජේතුංගගේ අදහසක් ද මීට යා කරමි.

“රූපවාහිනිය යනු සමාජ භූගෝලය සකස් කරන අච්චුවක්. ඉතා ම සීමිත පරාසයක චිත්ත වේගයන් අභිප්‍රේරණයන් හසුරුවාලීමට හැකි වුව ද, එය භාවනාවක් බවට පත්වීම නිසා අභ්‍යන්තර

ප්‍රවේශයන් තීරණය කිරීමට රූපවාහිනියට ඇති හැකියාව අවඥාවෙන් බැහැර කළ හැක්කක් නොවේ. දවසකට පැය හතරක් පහක් රූපවාහිනිය දෙස බලා සිටීමෙන් ඇති වන බලපෑම පහසුවෙන් නොසලකා හැරිය හැකි ද? එය ආකල්ප හා චර්යාවන් වෙනස් කිරීමට සමත් වී ඇත්තේ කෙසේ ද? යන්න විද්‍යාත්මක ශික්ෂණයක් සහිත ව සොයා බැලිය යුතුයි."[25]

කෙසේ වෙතත්, එබඳු ගැඹුරුතර ශික්ෂණයකින් කරන ලද විධිමත් පර්යේෂණ රාශියක නිගමන එක්රැස් කොට ලබා දුන් සංක්ෂිප්ත විවරණ දෙකක් අවසාන වශයෙන් මෙහි දී ඉදිරිපත් කරනු කැමැත්තෙමි.

පළමුවැන්න, ඊට තරමක් වෙනස් එතරම් තෘප්තිදායක නොවන්නක් වෙයි. මහාචාර්ය විල්බර් ශ්‍රාම්, ජැක් ලයිල් හා එඩ්වින් බී. පාකර් යන ජනමාධ්‍ය විශාරදවරුන්ගේ මැදිහත් දෘෂ්ටිවාදයන්හි සංකලනයක් ලෙස "Television in the Lives of Our Children" නමින් එළිදැකින වාර්තාවක් මඟින් මෙකී කාරණය අවධාරණය කෙරේ.

අසවල් ජන කණ්ඩායමට හෝ පරම්පරාවට හෝ මෙය සපුරා හානිකර හෝ ප්‍රතිඵලදායක හෝ යැයි කිව නොහැකි බවත්, විවිධ විචල්‍යතා, ස්වභාවයන් හා කොන්දේසි යටතේ එය විවිධ කණ්ඩායම් කෙරෙහි අඩු වැඩි වශයෙන් විවිධ බලපෑම් ඇති කරන බවත් ඔවුන්ගේ නිගමනයයි.[26]

දෙවැන්න, රූපවාහිනිය වූ කලි විවෘත ව ක්‍රියාත්මක කෙරෙන්නක් බැවිනුත්, එය දරුවාගෙ න් සඟවා තැබිය නොහැකි බැවිනුත් මතු දැක්වෙන ශෝචනීයතා වළකාලිය නොහැකි බව ප්‍රකට සමාජ මනෝවිද්‍යාඥ නීල් පෝස්ට්මන් (Neil Postman) 'ළමා කාලය අහිමි වීම' (The Disappearance of Chidhood) නමින් ලිපියක් ලියමින් කරන හෙළිදරව්වයි. ඒ අනුව ඔහුගේ අවධාරණය වනුයේ දරුවාගේ ළමා කාලය බොහෝ විට රූපවාහිනිය විසින් දරුවාට අහිමි කරවන බවත්, ලිංගිකත්වය, අපරාධ ක්‍රියා ඇතුළු ප්‍රචණ්ඩ ක්‍රියා කෙරෙන් මතු කෙරෙන ශත සහශ්‍ර සංඛ්‍යාත රෝග ව්‍යාධීන් එමඟින් මානව සමාජය වෙත ප්‍රවේශ කරවන බවත් ය. එකී සන්නිවේදනාර්ථය ඒ අයුරින් ම දක්වනු රිසියෙන් මම මෙහි දී නීල් පෝස්ට්මන් ඒ අයුරින් ම උපුටා දක්වනු කැමැත්තෙමි.

"Through such as occurrence, the innocence of childhood may be lost. In - effect, television helps to reveal the backstage of adult like to children; through television children come to know the secret of sex, the dangers of violence, the causes of material conflicts, the incompetence and dishonesty of our leaders, as well as the myriad diseases that can afflict the human body."[27]

රූපවාහිනී මාධ්‍ය බාලයන් අතට පත් කිරීම වඳුරන්ට දැළිපිහි ලබා දීමක් වන්නේ එබැවිනි. ඉතින්..., අප මීට වඩා කල්පනා කළ යුතු නොවේ ද?

## මූලාශ්‍ර


1. උක්ත සිද්ධියට අදාළ දරුවාගේ දෙමාපියන් විසින් ම ලබා දුන් වචන මෙහි සටහන් කොට ඇත්තේ එහි යථා ස්වභාවය සපුරා උපුටා දක්වනු රිසියෙනි.
2. එම
3. Eastman. Susan Tyler, Sydney W. Head and Lewis Klein: Television. Images and Mass Consciousness (2nd edition) Wodsworth. Belmont. Calif. 1981, p. 121
4. Ibid - Television. Images and Mass Consciousness. 1981. p. 122
5. Slant. Richerd (former President of Colombia Broadcasting Company. Washington) How Television makes up your mind; Essays on Television as a Social and Cultural Force. NY. 1986. p. 21

6. Ward, Sally, "Kids Television and Social Development: A Hand Book for Understanding the Media Effects, Cambridge University Press, UK, pp. 181-186

7. ද සිල්වා, සුගතපාල, 'හඬ නළුව හෙවත් ගුවන්විදුලි නාට්‍ය', එස්. ගොඩගේ සහෝදරයෝ, මරදාන පාර, කොළඹ 10, 1993, පිටුව 12

8. Ward, Sally, "Kids Television and Social Development: A Hand Book for Understanding the Media Effects. 1986, p. 117

9. Ward, Sally, Ibid, p. 118

10. අංගුත්තර නිකාය

11. අබේසිංහ, ඩබ්.ඒ., කවිය ගීතය හා සමාජය, (ළමා ගීයට පෙරවදනක්/8 වන පරිච්ඡේදය) සාරද ප්‍රකාශන, කුලියාපිටිය, 1992, පිටුව 83

12. Public Administration, Children and the future: A message from Mother Theresa to mark the International Commemoration of Children's media date, UNESCO Publication, 1925, preface, p. vii

13. ලෙනින්, ව්ලැඩිමීර් ඉල්විච්, ප්‍රෙස්න්‍යා දිස්ත්‍රික්කයේ ගුරුවරුන් උදෙසා 1918 ජූලි 26 වන දින කරන ලද ඇමතුමක දී උපුටා ගත්තක්. (The best things for children) 1956 ජූලි "කොමියුනිස්ට්" සඟරාවේ අංක 6 කලාපයෙහි "The Children, Property and the Nation" ලිපිය සඳහා ද උපුටා ගැනිණි.

14. Millicon, Max. F., (The most fundamental technological change is electronic communicational change in developing countries.) in Communication and National Development, edited by Daniel Lerner and Wilbur Schramme, p. 211

15. Pallow, James. D., (According to the research report on "Effects of Electronic Media and Social Changes, Conducted by the UNESCO)

16. Gamble, W. Michel and Gamble, Terri Kwal, Introduing Mass Communication (2nd edition) Chapter 8th, (Television assessing the Image) Mc Grow - Hill Book Company, Nw York. 1988, p. 253

17. Skornia, Harri J., The Great American Teacing Machine - of Violence, Intellect, USA, April, p. 347

18. According to Michel W. Gamble, "Heavy exposure to televised violence is one of the causes of aggressive behavior, crime and violence in Society" Prof. Leonard D. Eron, University of Illinois, Chicago. (The research report - follow up study by the National Institute of Mental Health Conference the original findings reaffirmed that a link between televised and antisocial behaviour does exist.)

19. Ibid, Leonard D. Eron / "Affects Youngesters of all ages, of both genders, at all social econimics levels of intelligence"

20. මහේන්ද්‍ර, සුනන්ද, ජනසන්නිවේදන නව ප්‍රවණතා, සංජනනී මාධ්‍ය සතිය - 2002 මුඛ්‍ය දේශන වාර්තාව, ජනසන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, 2002, පිටුව 08

21. The Administration Report, International Communication Agency, Embassy of USA, 1980, p. 18

22. "අමෙරිකාවේ විකල්ප රූපවාහිනියක්; ප්‍රබුද්ධ අමෙරිකානුවා වාණිජ රූපවාහිනියට විරුද්ධයි" නම් වූ සංවාද සටහන, TV ශ්‍රී ලංකා සඟරාව, ද සිරස පබ්ලිකේෂන් ප්‍රයිවට් ලිමිටඩ්, 1998 සැප්තැම්බර්, පිටුව 47

23. සිරිවර්ධන, රෙජී, 'අවිගත් රූපවාහිනිය', ගාමිණී විජේතුංග ලිපිය, 'දෙසතිය', රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රාජ්‍ය අමාත්‍යාංශය, කොළඹ, 1984 ජූලි 30, 26 සහ 27 පිටු

24. මහිම, ජයන්ත, 'කොපර කොපර පිපිඤ්ඤා - වීඩියෝ ගේම් ගසඤ්ඤා' ලිපිය, TV ශ්‍රී ලංකා සඟරාව, ද සිරස පබ්ලිකේෂන් ප්‍රයිවට් ලිමිටඩ්, 1998 ජූනි, 08 සහ 09 පිටු

25. විජේතුංග, ගාමිණී, 'අවිගත් රූපවාහිනිය' (ලිපිය) 'දෙසතිය', රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රාජ්‍ය අමාත්‍යාංශය, කොළඹ 1984 ජූලි 30, පිටුව 20

26. Introducing Mass Communication, chapt. 8, p. 254, "For some children, under some conditions, some television is harmful. For other children, under the same conditions, it may be beneficial. For most children, under most conditions, most television is probably neither harmful nor particularly beneficial."

27. Postman, Neil, The Disappearance of Chilhood; Delacorte, New York, 1982, p. 95